www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව එල්ටීටීඊ නායකයා පැහැරගෙන යයි

## Sri Lanka kidnaps LTTE leader

**සරත් කුමාර විසිනි**

**2009 අගෝස්තු 15**

පසුගිය සතියේ දී ශ්‍රී ලංකාවේ මිලිටරි බුද්ධි අංශයේ මෙහෙයුම් නිලධාරීන් කන්ඩායමක් අග්නිදිග ආසියාවේ දී බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ අලුතෙන් පත් කල නායකයා වන සෙල්වරාසා පද්මනාදන් අල්ලා ගෙන කොලඹට ගුවනින් ගෙන ආවේය. ඒ පිලිබඳ විස්තර තවමත් පැහැදිලි නැති මුත්, මෙම රහස් මෙහෙයුම මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් ද ජාත්‍යන්තර හා දේශීය නීතිය ද උල්ලංඝනය කර ඇත.

කේපී ලෙස ද හැඳින්වෙන පද්මනාදන් වසර ගනනාවක් තිස්සේ එල්ටීටීඊයේ අරමුදල් රැස්කිරීම හා අවි මිලට ගැනීම භාරව සිටි පුද්ගලයා යයි කියනු ලැබේ. පසුගිය මැයි මස මැද දී ශ්‍රී ලංකා මිලිටරිය එල්ටීටීඊය පරාජය කොට වී. ප්‍රභාකරන් ඇතුලු එහි ප්‍රධාන නායකයන් ඝාතනය කලාට පසුව, පද්මනාදන් සංවිධානයේ නායකත්වය පවරාගෙන පිටුවාහලේ ඊනියා අන්තර්ජාතික ආන්ඩුවක් පිහිටුවීම නිවේදනය කලේය.

ශ්‍රී ලංකා ආන්ඩුව, විශේෂයෙන් ම පද්මනාදන් හා පිටුවාහලේ සිටින සෙසු නායකයන් ඉලක්ක කරමින්, "ත්‍රස්තවාදී" එල්ටීටීඊය මර්දනය කරන ලෙස ලොව වටා රටවලට ආයාචනා කරමින් සිටී. පසුගිය සතියේ ඔහු අල්ලාගැනීමේ මෙහෙයුම මගින් පෙන්නුම් කෙරෙන්නේ, එල්ටීටීඊයේ ඉතිරිපහඳු විනාශ කර දැමීම පිනිස ඕනෑම දුරක් යාමට ශ්‍රී ලංකා තන්ත්‍රය සූදානම් බවයි.

මිලිටරි ප්‍රකාශක බ්‍රිගේඩියර් උදය නානායක්කාර ආරම්භයේ දී මාධ්‍යවලට කියා සිටියේ පද්මනාදන් තායිලන්තයේ දී අල්ලා ගත් බවයි. එහෙත් තායි අගමැති අභිසිත් වෙජ්ජාජිවා එය ප්‍රතික්ෂේප කලේය. ඉන් අනතුරුව මාධ්‍ය වාර්තා යෝජනා කලේ එල්ටීටීඊ නායකයා මැලේසියානු අගනුවර වන ක්වාලා ලම්පූර්හි ටියුන් හෝටලයේ දී අල්ලා ගෙන පසුව ශ්‍රී ලංකා මිලිටරි බුද්ධි අංශයේ මෙහෙයුම් නිලධාරීන්ට භාර දුන් බවයි. 2007 තායිලන්තයේ දී ඔහු අත්අඩංගුවට ගනු ලැබ එම අත්අඩංගුවෙන් පලායාමෙන් පසුව පද්මනාදන් මැලේසියාවට මාරු වූ බවක් පෙනී යයි.

මැලේසියානු අගමැති නජිබ් රසාක් තමන් අත "කාරනාව පිලිබඳව කිසිදු තොරතුරක් නැති" බව පවසමින් වාර්තාව තහවුරු කිරීමෙන් හෝ එය ප්‍රතික්ෂේප කිරීමෙන් වැලකී සිටි අතර ඒ පිලිබඳ නිල පරීක්ෂනයක් කැඳවීය. පද්මනාදන් අත්අඩංගුවට ගැනීමක් සිය ආරක්ෂක කැමරාවල සටහන් වී නැතැයි ටියුන් හෝටලයේ කලමනාකරනය පසුව වාර්තා කලේය.

මැලේසියානු ආන්ඩුව මෙම මෙහෙයුම ගැන දැන සිටි බවක් හෝ එයට සහයෝගී වූ බවක් ප්‍රතික්ෂේප කිරීම පුදුමයට කාරනාවක් නොවේ. ශ්‍රී ලංකාව සමග පවත්නා ආර්ථික හා දේශපාලන සබඳතා අවුල්කර ගැනීමක් හෝ මැලේසියාවේ සැලකිය යුතු ප්‍රමානයක ජන කන්ඩායමක් වන ජනවාර්ගික ඉන්දියානු සුලුතරය අතර මනෝගතියක් අවුලුවාගැනීමක් නජීබ්ට අවශ්‍ය නැත. මැයි මස දී මැලේසියානු පොලීසිය ශ්‍රී ලංකා මිලිටරියේ යුද අපරාධවලට එරෙහි දෙමල ජනයාගේ විරෝධතා මැඩීමට ක්‍රියා කලේය.

පද්මනාදන් මැලේසියාවේ දී අල්ලා ගත් බවට පලවන වාර්තා කොලඹ ආන්ඩුව ප්‍රතික්ෂේප කර නැත. මෙහෙයුම සිදු කර ඇත්තේ ආසියානු රටක නිලධාරීන්ගේ සහයෝගය සහිතව බව ආරක්ෂක ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ල අගෝස්තු 7 දා මාධ්‍යවලට පැවසීය. මැලේසියානු ආන්ඩුව හෝ එරට ආරක්ෂක යාන්ත්‍රනයේ කොටස් පද්මනාදන් අල්ලාගැනීමේ දී සිය ශ්‍රී ලංකාවේ සගයන් සමග හවුල් වූ බව නිසැකය.

ශ්‍රී ලංකාවේ මිලිටරි බුද්ධි අංශයට මැලේසියාවේ ආරක්ෂක හෝ බුද්ධි සංස්ථාපිතයේ සමහර කොටස්වල සහයෝගය ලැබුනු බවට බොහෝ සෙයින් ඉඩ ඇතැයි, එල්ටීටීඊයේ "අන්තර්ජාතික ආන්ඩුව" පිලියෙල කිරීම පිනිස පද්මනාදන් විසින් පත් කරන ලද විශ්වනාදන් රුද්‍රකුමරන් ද කියා සිටියේය.

එල්ටීටීඊයේ මිලිටරි බිඳවැටීමට ඉක්බිතිව, එහි පිටුවාහල් නායකත්වය තුල දරුනු මතභේද පැන නැගී තිබේ. එල්ටීටීඊ නායක ප්‍රභාකරන්ගේ මරනය නිවේදනය කිරීමත් මැදහත් ප්‍රවිෂ්ටයක් ඉදිරිපත් කිරීමත් නිසා පද්මනාදන් දැඩි විවේචනයට ලක්වුනි. ඩේලි මිරර් තීරු ලිපි රචකයකු වන ඩී.බී.එස්. ජෙයරාජ් මෙසේ යෝජනා කලේය: "එතෙර කොටි (එල්ටීටීඊ) මාධ්‍ය කොටස්වලින් කේපී වෙත එල්ල වූ දරුනු ප්‍රහාරය මගින් පෙන්නුම් කෙරෙන්නේ, කේපී සම්බන්ධයෙන් ඉතා ඉහල මට්ටමේ වෛරයක් පැවති බවයි. . . . කේපීගේ ගමන්බිමන් පිලිබඳව වටිනා "අභ්‍යන්තර" තොරතුරු පිටතට කාන්දු වී ඇති බවට බලගතු සැකයක් පවතී."

ශ්‍රී ලංකාවේ මෙහෙයුම එක්සත් ජනපදයට එරෙහි සැප්තැම්බර් 11 ප්‍රහාරයට ඉක්බිතිව එක්සත් ජනපදය විසින් තහවුරු කරන ලද ශෛලිය අනුව යයි. දේශීය බලධාරින්ගේ සහයෝගිත්වය ඇතිව හෝ නැතිව, ලොව වටා "ත්‍රස්තවාදී සැකකරුවන්" ගනනාවක් පැහැරගැනීම සම්බන්ධයෙන් ඇමරිකානු ඒජන්තයන් වගකිව යුතුව ඇත. රැඳවියෝ එක්කෝ ගුවන්තනාමෝ බේ වැනි සිර කඳවුරුවලට යවනු ලදි, නැතහොත් ප්‍රශ්න කිරීම හා වධබන්ධනයට ලක් කරනු පිනිස තෙවන රටක් වෙත "උදර්පනය" කරන ලදි.

ජාත්‍යන්තර පොලීසිය නීති විරෝධී ගිනි අවි ප්‍රවාහනය පිලිබඳ චෝදනා මත මීට වසර ගනනාවකට ඉහත දී පද්මනාදන් අත්අඩංගුවට ගැනීමට වරෙන්තු නිකුත් කලේය. 1991 දී මරාගෙන මැරෙන බෝම්බකරුවකු විසින් හිටපු අගමැති රජිව් ගාන්ධි ඝාතනය කිරීමට සම්බන්ධිතව ඔහු ඉන්දියාවට අවශ්‍ය කරන පුද්ගලයන්ගේ ලැයිස්තුවේ ද සිටී. එහෙත් පද්මනාදන් අල්ලා ගැනීම අත්අඩංගුවට ගැනීම හා උදර්පනය පිලිබඳ සාමාන්‍ය නෛතික ක්‍රියාදාමය උල්ලංඝනය කර ඇත. මැලේසියානු බලධාරින්ගේ සහයෝගය ඇතිව හෝ නැතිව ඔහු පැහැර ගෙන ඔහුගේ සහායක "අප්පු" නැමැත්තා සමග රහසේ රටින් පිටතට ගෙන ගොස් තිබේ. දෙදෙනාම, නඩු විභාගවලින් තොරව, වධබන්ධන සම්බන්ධයෙන් කුප්‍රකට ත්‍රස්ත විමර්ශන ඒකකයේ (ටීඅයිඩී) අත්අඩංගුවේ රඳවා ගෙන සිටී.

වඩා පුලුල් කඩාපැනීමක් සඳහා සූදානම්ක ලෙස එල්ටීටීඊයේ ජාත්‍යන්තර ජාලය පිලිබඳ තොරතුරු මිරිකා ගනු පිනිස පොලීසිය හා මිලිටරිය පද්මනාදන්ගෙන් ප්‍රශ්න කරමින් සිටින බව කොලඹ මාධ්‍ය වාර්තා කර තිබේ. පෙර නොවූ විරූ ලෙස, ජනාධිපති මහින්ද රාජපක්ෂගේ සොහොයුරා වන, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ පසුගිය සතියේ පැයක් තිස්සේ පද්මනාදන්ගෙන් ප්‍රශ්න කලේය.

මෙම පැහැරගැනීම ශ්‍රී ලංකා ආන්ඩුවේ හා රාජ්‍ය යාන්ත්‍රනයේ ඉහලම මට්ටම්වල සැලසුම් කරන ලදි. නේෂන් තීරු ලිපි රචක තිස්ස රවින්ද්‍ර පෙරේරාට අනුවඃ "සමස්ත මෙහෙයුම ම ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ සහ ජාතික බුද්ධි අංශයේ ප්‍රධානි මේජර් ජෙනරාල් කපිල හෙන්දවිතාරන විසින් රහසේ සැලසුම් කරන ලදි." ආන්ඩුව "කේපී මෙහෙයුම" සම්බන්ධීකරනය කරනු පිනිස ක්වාලා ලම්පූර්හි නියෝජ්‍ය මහ කොමසාරිස් ලෙස බ්‍රිගේඩියර් උදය පෙරේරා මෑත දී පත් කල බව තීරු ලිපි රචක ජෙයරාජ් ලිවීය.

ආන්ඩුව හා මාධ්‍ය මෙහෙයුමේ සාර්ථකත්වය පිලිබඳව විවෘතව ම පුරසාරම් දොඩා ඇත. "ශ්‍රී ලංකාවඃ ආසියාවේ නව ඊස්රායලය" යන ශීර්ෂ පාඨයෙන් ඩේලි මිරර් පත්‍රයේ පල වූ කතුවැකියක්, විවිධ පලස්තීන කන්ඩායම්වල නායකයන් දඩයම් කිරීමෙහි ලා හා සමහර අවස්ථාවන්හි දී ඔවුන් ඝාතනය කිරීමෙහි ලා ඊස්රායලයේ කුප්‍රකට මොසාඩ් සංවිධානයේ නීති විරෝධී ක්‍රියාකාරකම් සමග ශ්‍රී ලංකා මිලිටරි බුද්ධි අංශය සන්සන්දනය කලේය.

"ලෝකයේ වඩාත්ම සූක්ෂ්ම ත්‍රස්තවාදී කන්ඩායමේ සමස්ත දේශීය නායකත්වයම සමූලඝාතනය කර දැමීමේ ක්‍රියාව තිතටම සිදු කිරීම විදේශයන්ගෙන් ශ්‍රී ලංකාවට ලැබිය යුතු ප්‍රශංසාව දිනාගැනීමට අසමත් වුනි නම්, එවිට අඩු ගනනේ මෙය, මෙහි සැලකිල්ලට ගත යුතු බලයක් පවතින බව ගෝලීය බලවතුන්ට අවබෝධ කරවනු ඇත. ඔවුන්ගේ ම සතුරන් අල්ලාගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා චර පුරුෂයන්ගේ සහාය ඉල්ලා සිටීමට සමහර ජාතීන් තීරනය කල හොත් එය පුදුමයට කාරනාවක් නොවිය යුතුය." යයි කතුවැකිය පුරසාරම් දොඩයි.

මෙම මෙහෙයුම ප්‍රජාතන්ත්‍ර අයිතීන් හා මේ අවස්ථාව සම්බන්ධයෙන් ගත හොත් ජාත්‍යන්තර නීතිය පිලිබඳ ආන්ඩුවේ පිලිකුල තවත් වතාවක් පෙන්නුම් කිරීමකි. තන්ත්‍රය මේ අවස්ථාවේ ඔවුන්ගේ අයිතීන් උල්ලංඝනය කරමින් 300,000කට ආසන්න දෙමල සිවිල් වැසියන් පිරිසක් රඳවා ගෙන සිටී. දහස් සංඛ්‍යාත තරුන ජනයා රහස් සිරගෙවල්වල දී වඩා තියුනු ප්‍රශ්න කිරීම්වලට ලක් කරනු පිනිස එම රැඳවුම් කඳවුරුවලින් පිටතට ඇදගෙන යනු ලැබ ඇත. එම ස්ථානවල ඔවුන් චෝදනා රහිතව දින නියමයක් නැතිව තබා ගත හැකිය. පසුගිය වසර තුන තිස්සේ, ආරක්ෂක හමුදා සමග සහයෝගයෙන් ක්‍රියා කරන ආන්ඩු-ගැති ඝාතක කල්ලි විසින් සිය ගනනක් මරා දමා හෝ "අතුරුදහන්" කරනු ලැබ ඇත.

සිවිල් යුද්ධයේ දශක දෙකකට වැඩි කාල පරිච්ඡේදය තිස්සේ ගොඩනගන ලද ආරක්ෂක හමුදාවන්ගේ පරිමාව අඩු කිරීමක් වෙනුවට, රාජපක්ෂ ආන්ඩුව හමුදාව හා පොලීසිය ප්‍රසාරනය කරමින් සිටී. රැකියා, වැටුප් හා අත්‍යවශ්‍ය සේවාවන්ට විරුද්ධව තීව්‍ර කෙරෙන ප්‍රහාරයන්ට එරෙහිව සිය ජීවන මට්ටම් ආරක්ෂා කර ගැනීමට ඔවුන් උත්සාහ කරන විට කම්කරුවන්ට හා ගම්බද දුගීන්ට ඍජුව ම විරුද්ධව ආන්ඩුවේ පොලිස්-රාජ්‍ය විධික්‍රම, ප්‍රමාද වී නොව ඉක්මනින් ම එල්ල වනු ඇත. රටේ ගැඹුරු වන ආර්ථික අර්බුදයේ බර කම්කරු පන්තිය මත කඩාපාත් කරනු පිනිස රාජපක්ෂ දැනටමත් "ආර්ථික යුද්ධයක්" ප්‍රකාශයට පත් කොට ඇත.

© www.wsws.org